# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1877/2 - 2014 අගෝස්තු මස 25 වැනි සඳුදා - 2014.08.25

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*යොමු අංකය:* 6/3/1/503.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට රජය අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 07 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩම පිළිබඳ විස්තර :*

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, කුඹුක පත්තුවේ, හොරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කුඹුක ගමේ පිහිටි සර්වේ ජනරාල් විසින් සම්පාදිත මු.පි.ක. 4408 හා 2013.06.28 දිනැති මූලික පිඹුරේ කැබලි අංක 01 වශයෙන් පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්ටයාර 0.1004 පමණ වන ගල්ගොඩකැලේ නැමති ඉඩමට මායිම්:

01. **කැබලි අංක 01**

*උතුරට*: මු.පි.ක. 1410හි කැබලි අංක 01 සහ රසංගිකා සුදර්ශනී දසනායක සහ තවත් අය හිමිකම් කියන ජම්බුසිංහවත්ත; *නැගෙනහිරට*: රසංගිකා සුදර්ශනී දසනායක සහ තවත් අය හිමිකම් කියන ජම්බුසිංහවත්ත, මු.පි.ක. 1410හි කැබලි අංක 01 සහ මාර්ගය; *දකුණට*: මාර්ගය සහ මු.පි.ක. 1410හි කැබලි අංක 01; *බටහිරට*: මු.පි.ක. 1410හි කැබලි අංක 01.

ඉඩමට මුල් හිමිකම් පාන්නා ; රජය

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම, තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2014 සැප්තැම්බර් මස 19 වැනි දින පෙ. ව. 10.00ට හොරණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2014 සැප්තැම්බර් මස 12 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම/පරවශතාවයට ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය.

කේ. ඒ. ඩී. ආර්. නිශාන්ති ජයසිංහ,
ප්‍රාදේශීය ලේකම්,
හොරණ.

2014 අගෝස්තු මස 29 වැනි දින,
හොරණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

09 - 225

---

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ යොමු අංකය:* බිපළ/03/01/78.
*ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයේ යොමු අංකය* : 4/3/3/2010/ WS/276.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ 07 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර :*

අම්පාර දිස්ත්‍රික්කයේ, මහඔය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, බින්තැන්න පත්තු උතුර සුළු කොට්ඨාසයේ, නිල්ඔබ ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් මැන සකස් කරන ලද මූලික පිඹුරු අංක ටෝ පෝ පී.පී 24හි අතුරු පිඹුරු අංක 143හි කැබලි අංක 2492, 2493, 2494 වශයෙන් දැක්වෙන මගහලන්ද නැමති ඉඩම් කොටස් ප්‍රමාණයෙන් හෙක්. 0.8671 පමණ වූ පහත සඳහන් මායිම් තුළ පිහිටි ඉඩම් කොටසට මායිම්:



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

01. **කැබලි අංක 2492 - මගහලන්ද - ප්‍රමාණය : හෙක්. 0.5682**

උතුරට: කැබලි අංක 2495; නැගෙනහිරට: කැබලි අංක 2495; දකුණට: කැබලි අංක 2495; බටහිරට: කැබලි අංක 2495.

02. **කැබලි අංක 2493 - මගහලන්ද - ප්‍රමාණය : හෙක්. 0.0713**

උතුරට: කැබලි අංක 2491 හා 2489; නැගෙනහිරට: කැබලි අංක 2488 හා 2495; දකුණට: කැබලි අංක 2495 හා 2494; බටහිරට: කැබලි අංක 2494 හා 2495.

03. **කැබලි අංක 2494 - මගහලන්ද - ප්‍රමාණය : හෙක්. 0.2276**

උතුරට: කැබලි අංක 2493; නැගෙනහිරට: කැබලි අංක 2493 හා 2495; දකුණට: කැබලි අංක 2495; බටහිරට: කැබලි අංක 2495.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම, තමතමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2014 සැප්තැම්බර් මස 16 වැනි දින පෙ. ව. 10.00ට මහඔය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2014 සැප්තැම්බර් මස 10 වැනි දිනට මත්තෙන් ඒ සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු යි. හිමිකම් කීම පිළිබඳ ඔප්පු ආදිය පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතු ය.

ආර්. එම්. එන්. විජයතුංග,
ප්‍රාදේශීය ලේකම්,
මහඔය.

2014 අගෝස්තු මස 08 වැනි දින,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
මහඔය.

09 - 226/1

---

**ඉඩම් අත්පත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ යොමු අංකය:* බිපළ/03/1/78.
*ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයේ යොමු අංකය*: 4/3/3/2010/WS/276.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 07 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තරය :*

අම්පාර දිස්ත්‍රික්කයේ, මහඔය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, බින්තැන්න පත්තු උතුර සුළු කොට්ඨාසයේ නිල්ඔබ ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් මැන සකස් කරන ලද මූලික පිඹුරු අංක ටෝ පෝ පී.පී 24හි අතිරේක අංක 5හි කැබලි අංක 2487, 2489, 2491 වශයෙන් දැක්වෙන මගහලන්ද නමැති ඉඩම් කොටස් ප්‍රමාණයෙන් හෙක්. 0.7192 පමණ වූ පහත සඳහන් ඉඩම් කොටසට මායිම්:

01. **කැබලි අංක 2487 - මගහලන්ද - ප්‍රමාණය : හෙක්. 0.2277**

උතුරට: කැබලි අංක 2486; නැගෙනහිරට: කැබලි අංක 2486; දකුණට: කැබලි අංක 2488 හා 2489; බටහිරට: කැබලි අංක 2489, 2490 හා 2486.

02. **කැබලි අංක 2489 - මගහලන්ද - ප්‍රමාණය : හෙක්. 0.4640**

උතුරට: කැබලි අංක 2486 හා 2487; නැගෙනහිරට: කැබලි අංක 2487, 2486 හා 2488; දකුණට: කැබලි අංක 2488 හා 2485; බටහිරට: කැබලි අංක 2491 හා 2490.

03. **කැබලි අංක 2491 - මගහලන්ද - ප්‍රමාණය : හෙක්. 0.0275**

උතුරට: කැබලි අංක 2490 හා 2489; නැගෙනහිරට: කැබලි අංක 2489 හා 2485; දකුණට: කැබලි අංක 2485; බටහිරට: කැබලි අංක 806 හා 2490.

ඉහත සඳහන් ඉඩමට හිමිකම් අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම, තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2014 සැප්තැම්බර් මස 16 වැනි දින පෙ. ව. 10.00ට මහඔය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2014 සැප්තැම්බර් මස 10 වැනි දිනට මත්තෙන් ඒ සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු යි. හිමිකම් කීම පිළිබඳ ඔප්පු ආදිය පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතු ය.

ආර්. එම්. එන්. විජයතුංග,
ප්‍රාදේශීය ලේකම්,
මහඔය.

2014 අගෝස්තු මස 08 වැනි දින,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
මහඔය.

09 - 226/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.